සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 9 - 2019

නම : ............................................. **ඉස්ලාම් ධර්මය** කාලය : පැය 02 යි.

❖ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

### I කොටස

- ඉතා සුදුසු පිළිතුර යටින් ඉරක් අඳින්න.

(1) කොන්ස්තාන්තිනෝබලය ජයග්‍රහණය කළ යුධ විරුවරයාණන් කව්රුන් ද?
1. තාරික් බින් සියාද් 2. මුහම්මද් අල් ෆාතිහ්
3. සලාහුදීන් අය්යුබි 4. ඉමාමුදීන් සන්කි

(2) හාරූන් (අලෛ) තුමාණන්ගේ සහෝදරයාණන් කව්රු ද?
1. නූහ් (අලෛ) 2. ෂීද් (අලෛ) 3. මූසා (අලෛ) 4. ඊසා (අලෛ)

(3) ''උම්මුල් මසාකීන්'' යන විශේෂිත නමින් හැඳින්වූයේ කව්රුන් ද?
1. සෙයිනබ් බින්ද් හුසෙයි මා (රලි) 2. සෙයිනබ් බින්ද් ජහ්ෂ් (රලි)
3. උම්මු හබීමා (රලි) 4. මයිමූනා (රලි)

(4) මදීනා සාසනය - ගිවිසුම කරනු ලැබූ වර්ෂය
1. ක්‍රි.ව. 570 2. ක්‍රි.ව. 600 3. ක්‍රි.ව. 612 4. ක්‍රි.ව. 622

(5) හලීපා අබුබකර් (රලි) තුමාණන්ගේ පාලන සමයේ හාෆීල්වරයන් වැඩි දෙනෙක් ෂහීද්වූ යුද්ධය,
1. උහද් යුද්ධය 2. යමාමා යුද්ධය 3. බද්ර් යුද්ධය 4. තබුක් යුද්ධය

- පහත සඳහන් කරුණු අතරින් සුදුසු වචන තෝරා ගළපන්න.

| | |
|---|---|
| (6) සහීහෙයින් | සලාහුදීන් අය්යුබි (රහ්) |
| (7) ඉස්තිඃෆාර් | සහීහුල් බුහාරි, සහීහ් මුස්ලිම් |
| (8) හජ්ජතුල් විදා | කමා අයැදීම. |
| (9) පලස්තීනය ජයග්‍රහණය | වහී ලියන්නන් |
| (10) කුත්තාබුල් වහී | අවසන් හජ් |

- පහත සඳහන් කරුණු නිවැරැදි නම් (✓) යනුවෙන් ද, වැරදි නම් (✗) යනුවෙන් ද ලකුණු කරන්න.

(11) ෆිර්අව්න්ගේ මාලිගාවේ මුසා (අලෛ) හැදුනාහ. ( )

(12) යව්මුත් තර්වියා දුල්හජ් නවවන දිනය වේ. ( )

(13) තර්තීබුත් තිලාවත් යනු පරායනය කරන ක්‍රමයකි. ( )

(14) අබිසීනියාවේ රජුවරයා නජ්ජාෂි වේ. ( )

(15) ''දිග දෑත් තිබෙන්නා'' යනුවෙන් නබිතුමාණන් මයිමූනා (රලි) තුමිය හැඳින්වූහ. ( )

● පහත සඳහන් ප්‍රශ්නවලට සුදුසු වචන තෝරා හිස්තැන් පුරවන්න.

(16) ෂුඅයිබ් (අලෛ) තුමාණන්ගේ දියණිය ........................................................ තුමාණන් විවාහ කළහ.

(17) ඉමාම් මුස්ලිම් (රහ්) තුමාණන් ........................................................ යන ස්ථානයේ උපත ලැබූහ.

(18) ........................................................ තුමාණන් හට ඉන්ජීල් ආගම් කෘතිය පහළ වීය.

(19) නබි (සල්) තුමාණන්ගේ අවසන් භාර්යාව ........................................................ වේ.

(20) ........................................................ දේශ සංචාරකයින්ගෙන් කෙනෙක් වේ.

(නයිසාපුර්, ඉබ්නු බතුතා, ඊසා (අලෛ) මූසා (අලෛ), මය්මුනා (රලි)

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

❖ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.

❖ තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු ලියන්න.

01. කෙටි උත්තර සපයන්න.

1. ශ්‍රී ලංකා වැසියන් පිළිපදින ආගම් දෙකක් ලියන්න.
2. ඊජිප්තුවේ ආහාර කටයුතු සඳහා වූ ඇමතිවරයා වූයේ කව්රුන් ද?
3. කොන්ස්තාන්නි නෝබල් නම් නගරය දැනට කෙසේ හඳුන්වන්නේ ද?
4. පරමාන්ත දිනය පිළිබඳ විශ්වාසය හැඳින්වෙන නම් දෙකක් සඳහන් කරන්න.
5. සලාතයේ කස්ර් හා ජම්උ යනුවෙන් සඳහන් වන්නේ කුමක් ද?
6. ''මහබ්බතුර් රසූල්'' යනු කුමක් ද?
7. නබි (සල්) තුමාණන්ගේ භාර්යාවව සිටි අබුසුෆ්යාණන්ගේ දියණිය කව්රුන් ද?
8. කලීෆා උස්මාන් (රලි) තුමාණන්ගේ විශේෂිත නම කුමක් ද?
9. ඊසා (අලෛ) තුමාණන් හට ලබා දෙන ලද ප්‍රාතිහාර්යය දෙකක් සඳහන් කරන්න.
10. පුරුෂයින් පැළඳීමට තහනම් කරන ලද පළඳනා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2 × 10 = 20)

02. 1. ආගමික කෘති ලබාදෙන ලද නබිවරුන් තිදෙනෙක් නම් කරන්න.
2. ජනාසාවක් වෙනුවෙන් ඉටු කළ යුතු වගකීම් සඳහන් කරන්න.
3. ජනාබතය (මහා කිල්ල) ඇති කරන කරුණු කුමක් ද? (ලකුණු 3 + 3 + 4 = 10)

03. 1. උම්මහාතුල් මුඃමිනුන් යනුවෙන් හඳුන්වන්නේ කව්රුන් ද?
2. උම්මහාතුල් මුඃමිනුන්වරුන් තිදෙනෙක් නම් කරන්න.
3. ඉස්ලාම් ධර්මයේ ජයග්‍රහණය සඳහා උම්මහාදල් මුඃමිනුන්වරුන් කළ සේවාවන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 3 + 3 + 4 = 10)

04. 1. ''සිහාහුස් සිත්තාහි'' අඩංගු හදීස් ග්‍රන්ථ තුනක් සඳහන් කරන්න.
2. මුහම්මද් අල්ෆාතිහ් කොටුව අත්පත් කරගැනීම සඳහ උපයෝගී කරගත් ජලාශය කුමක් ද?
3. මුහම්මද් අල්ෆාතිහ් ඉස්තන්බුලය ජයග්‍රහණය කළයින් අනතුරුව මහජනයා වෙත කථාවේ අඩංගු කරුණු සඳහන් කරන්න. (ලකුණු 3 + 3 + 4 = 10)

05. 1. සෑම මිනිසෙක්ම සහෝදරයන් වේ යනුවෙන් සඳහන් වූ හදීසයක් ලියන්න.
2. බුදුන් වහන්සේ දක්කා වූ දුක්මුසු අවස්ථා තුන සඳහන් කරන්න.
3. ඉන්දු ධර්මයේ මූලාශ්‍ර ග්‍රන්ථ හතර නම් කරන්න. (ලකුණු 3 + 3 + 4 = 10)

06. 1. අජ්නබි, මහ්රම් යනු කුමක් ද?
2. ක්‍රියාවන් හා සම්බන්ධ වූ හරාම් තුනක් ලියන්න.
3. ඔබ ජීවත්වන පරිසරයේ දකින්නට ලැබෙන හරාම් වූ ක්‍රියාවන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 3 + 3 + 4 = 10)

07. 1. සකාත් අනිවාර්ය වූ ද්‍රව්‍ය තුනක් සඳහන් කරන්න.
2. සහජීවනය ඇති කිරීම සඳහා වූ ක්‍රම තුනක් සඳහන් කරන්න.
3. මූසා (අලෛ) තුමාණන් හට ලබාදෙන ලද හාස්කම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 3 + 3 + 4 = 10)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 9 - 2019

### ඉස්ලාම් ධර්මය පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | |
|---|---|---|---|---|
| (1) 2 | (2) 3 | (3) 1 | (4) 4 | (5) 2 |
| (6) සහීහ්බුහාරි, සහීහ් මුස්ලිම් | (7) කමා අයැදීම. | (8) අවසන් හජ් | (9) සලාහුදීන් අය්යුබි | (10) වහි ලියන්නන් |
| (11) ✓ | (12) ✗ | (13) ✓ | (14) ✓ | (15) ✗ |
| (16) මූසා (අලෛ) | (17) නයිසාපූර් | (18) ඊසා (අලෛ) | (19) මයිමූනා (රලි) | (20) ඉබ්නු බතූතා |

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

(01) (1) ඉස්ලාම්, බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි
(2) යූසුෆ් (අලෛ)
(3) ඉස්තන්බූල්
(4) යව්මුල් බඃස්, යව්මුල් හිසාබ්, යව්මුල් කියාමා
(5) කස්රු - කෙටිකර සලාතය කිරීම.
ජම්උ - සම්බන්ධ කර සලාතය කිරීම.
(6) නබි (සල්) තුමාණන් කෙරෙහි වූ ආදරය
(7) උම්මු හබීබා (රලි)
(8) ජාමිඋල් කුර්ආන් - දින්නූරෙයින්
(9) මළවුන් යළි උපදවීම.
උපත් අන්ධයින් හා ළාදුරු රෝගීන් සුව කිරීම.
(10) සේද ඇඳුම්, රන් ආභරණ

(ලකුණු 2 × 10 = 20)

(02) (1) මූසා (අලෛ), දාවූද් (අලෛ), ඊසා (අලෛ), මුහම්මද් (සල්),

(2) ස්නානය කිරීම, කපන් කිරීම, සලාතය ඉටු කිරීම, වැළලීම.

(3) මුස්ලිම්වරයෙක් මියයෑම, සංසර්ගයේ යෙදීම, නින්දේදී හෝ අවදියේ ධාතු පිටවීම, හයිල් නිෆාස් ඇති වීම.

(03) (1) නබි (සල්) තුමාණන්ගේ බිරින්දෑවරුන් - විශ්වාසවන්තයින්ගේ මව්වරුන්

(2) කදීජා(රලි), ආයිෂා (රලි), සව්දා (රලි), සෆියියා (රලි) වැනි

(3) නබි (සල්) තුමාණන් හට සේවය කිරීම.
අදහස් ලබා දීම.
ඔවුන්ගේ දේශනාවන් හට ආදර්ශමත් වීම.
ධර්මය ඔවුන්ගේ ඉගෙනගෙන අන් අයට ඉගැන්වීම.

(ලකුණු 3 + 3 + 4 = 10)

(04) (1) සහිහුල් බුහාරි, සහීහ් මුස්ලිම් සුනන් ඉබ්නු මාජා ජාමි උත් තිර්මිදි, සුනන් නසඉ, සුනන් අබූ දාවූද්
(2) අල් කර්නුස් සහබි
(3) කොන්ස්තාන්ති නෝබලය ජයග්‍රහණය කළ වීර පුරුෂයින් වූහ.
නබි (සල්) තුමාණන්ගේ සුද්ධ වදන නිදර්ශනය කල වලුනි
ඔවුන්ගේ ආශිර්වාදය ලබා ගත්වරුනී

(ලකුණු 3 + 3 + 4 = 10)

(05) (1) ''මහපොළොවේ ජීවත් වන ජීවීන්ව ඔබ ආදරය කරනවානම් අහසේ සිටින දෙවියන් ඔබට ආදරය කරාවි.'' (තිර්මිදි)
(2) වයෝ වෘද්ධිකයෙක්, රෝගියෙක්, මලමිනියක් දුටුවූහ.
(3) ඉරුක්කු, සාමම්, යසූර්, අධර්වම්

(ලකුණු 3 + 3 + 4 = 10)

(06) (1) අජ්නබි - විවාහ වීමට අවසරලත් අය
මහ්රම් - විවාහ වීමට තහනම් අය
(2) බොරු කීම, රැවටීම, නිර්වස්ත්‍රව ක්‍රියා කිරීම.
(3) වංචාව, පොළිය, දූෂණය, සොරකම

(ලකුණු 3 + 3 + 4 = 10)

(07) (1) රත්තරන්, රිදී, මුදල්, ගවයින්, ධාන්‍ය
(2) අසල්වැසියන් සමඟ යහපත් සම්බන්ධකම් ඇති කරගැනීම.
දුෂ්කර අවස්ථාවන්වල එකිනෙකාට උපකාර වීම.
ප්‍රාදේශීය ජාතික සුභ සාධනය, සංවර්ධනය වෙනුවෙන් දායක වීම.
(පොතේ ඇති කරුණු සැලකිල්ලට ගන්න.)
(3) දැත් ආලෝකමත් වීම.
හැරමිටිය සර්පයෙක් වීම.

(ලකුණු 3 + 3 + 4 = 10)